# දියවැඩියා සුවයට කැඳ වට්ටෝරුවක්

‘ මේ කැඳ විශේෂය මගින් සිරුරේ තැන්පත්ව ඇති ස්ථාවර හා ජංගම විෂ ඉවත්වී සිරුරේ ඉන්ද්‍රියයන් පිරිසිදු වේ. ස්ථාවර විෂ යනු කෘෂි රසායන ද්‍රව්‍ය, බටහිර ඖෂධ හා වෙනත් විවිධ මාර්ගවලින් සිරුරේ තැන්පත් වන විෂ වර්ගයි. මේ දිනවල බොහෝ කතාබහට ලක්ව ඇති සයනයිඩ්, කැඩ්මියම් ආදිය ස්ථාවර විෂට උදාහරණ වශයෙන් දැක්විය හැකියි. ජංගම විෂ යනු සර්ප, මකුළු වැනි සතුන් දෂ්ට කිරීම නිසා සිරුරේ තැන්පත් වන විෂයි. මේ කැඳ භාවිතය මගින් මේ සියලු ආකාරයේ විෂ සිරුරෙන් ඉවත්ව ඉන්ද්‍රියයන් ප්‍රකෘති තත්වයට පත් වේ. ’





පසුගිය සතියේ 'දියවැඩියාව නිට්ටාවටම සුවකරන විස්කම් ප්‍රතිකාරයක් නමින් පළ කෙරුණු ලිපියට 'රිවිර' පාඨකයන්ගෙන් ලැබෙන ප්‍රතිචාරය අති විශාලය. සිය ගණනක් 'රිවිර' පාඨකයෝ ලක්ෂ්මන් ඇඹුල්දෙණිය මහතා හමුවී ප්‍රතිකාර ගැනීමේ බලාපොරොත්තුවෙන් දුරකතනයෙන් අප ඇමතූහ. මේ ප්‍රතිකාරය ඇඹුල්දෙණිය මහතා වාණිජ පරමාර්ථයෙන් ඇරඹූවක් නොව පර්යේෂණ කාර්යයක් වශයෙන් අරඹන ලද්දකි. එහෙයින් විශාල පිරිසකට ප්‍රතිකාර කිරීමේ දුෂ්කරතා ඇතැයි ඔහු කියයි එසේ වුවත් හැකි උපරිම පිරිසකට ප්‍රතිකාර ලබාදීමට ඇඹුල්දෙණිය මහතා එකඟතාව පළ කළේය.

ඒ අතර දියවැඩියා රෝගයෙන් පෙළෙන්නන්ට පාවිච්චි කිරීමට සුදුසු සේ ඇඹුල්දෙණිය මහතා සැකසූ විශේෂ කළු හීනැටි කැඳක් අද දින 'රිවිර' පාඨකයන්ට හඳුන්වා දෙමු. මෙය මලියදේව මහ රහතන් වහන්සේට ප්‍රතිකාර පිණිස 'සුළුගුලු' වෛද්‍යාචාර්යවරයා භාවිතා කළ 'රසගුලු' යාගුව (කැඳ) ඇසුරින් සකසන ලද එකකි. මෙය දියවැඩියා රෝගීන්ට පමණක් නොව වෙනත් ඕනෑම පුද්ගලයෙකුට වුව පාවිච්චි කළ හැකිය.

මේ කැඳ විශේෂය මගින් සිරුරේ තැන්පත්ව ඇති ස්ථාවර හා ජංගම විෂ ඉවත්වී සිරුරේ ඉන්ද්‍රියයන් පිරිසිදු වේ. ස්ථාවර විෂ යනු කෘෂි රසායන ද්‍රව්‍ය, බටහිර ඖෂධ හා වෙනත් විවිධ මාර්ගවලින් සිරුරේ තැන්පත් වන විෂ වර්ගයි. මේ දිනවල බොහෝ කතාබහට ලක්ව ඇති සයනයිඩ්, කැඩ්මියම් ආදිය ස්ථාවර විෂට උදාහරණ වශයෙන් දැක්විය හැකියි.

